වවුනියා නගර සභාව

වවුනියා දිස්ත්‍රික්කය

-----------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම

---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2014 අගෝස්තු 08 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 මාර්තු 28 දින ඉදිරිපත් කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 නොවැම්බර් 26 දින නගර සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

1.2 මතය

-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ සඳහන් කරුණු වලින් මූල්‍ය ප්‍රකාශයන්ට වන බලපෑම් හැර 2013 දෙසැම්බර් 31 දිනට වවුනියා  නගර සභාවේ වැඩකටයුතු වල තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන පරිදි පොදු සම්මත ගිණුමකරණ මූලධර්මයන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්

-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) මූල්‍ය ප්‍රකාශයන් සමග මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිනුම්කරණ ප්‍රතිපත්ති  අනාවරණය කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා වූ හිඟ උසාවි දඩ මුදල් ප්‍රමාණය රු.10,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) පරිත්‍යාග ලෙස ලැබී තිබුණු බස් රථ 5 ක් අගය කර ගිණුම් ගතකර නොතිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

-----------------------------------------------

අවශ්‍ය සාක්ෂි නොමැති වීම නිසා වටිනාකම රු.81,92ෙ5 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

1.3.3 අනුකූල නොවීම්

----------------------

එකතුව රු.1,163,098 ක් වූ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව 2013 දෙසැම්බර් 31 දිනට සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම අතිරික්තය රු.21,654,417 ක් වූ අතර එයට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය රු.12,390,503 ක් විය.

2.2 ලැබිය යුතු ගිණුම්

------------------------

(අ) වර්ෂ ගණනාවක් සඳහා විදුලි විවිධ ණය හිමියන්ගේ හිඟ මුදල් ප්‍රමාණය 2013 දෙසැම්බර් 31 දිනට රු.8,805,091 ක් විය.

(ආ) 1995 දී විවිධ ණයගැතියෙකුට වැඩිපුර ගෙවන ලද රු.17,960 ක් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපණම් සහ බදු | 22,546,800 | 23,596,884 | 32,630,523 |
| බදු කුලී | 29,148,380 | 27,970,238 | 1,880,320 |
| බලපත්‍ර ගාස්තු | 2,002,500 | 2,036,995 | 6,486,881 |
| වෙනත් ආදායම් | 93,148,500 | 68,869,794 | 1,092,774 |
| එකතුව | 146,846,180 | 122,473,911 | 42,090,498 |

2.3.2 උසාවි දඩ

2013 දෙසැම්බර් 31 දිනට උතුරු පළාතේ ප්‍රධාන ලේකම්වරයාගෙන් රු.6,476,881 ක් වූ උසාවි දඩ අයවීමට තිබුණි.

2.3.3. නිෂ්ක්‍රීය සහ ඌන උපයෝජිත වත්කම්

සභාවට අයත් වාහන 17 ක් භාවිතා නොකොට නිෂ්ක්‍රීයව පැවතුණි.

2.3.4 හිඟ ආදායම්

------------------

ඉකුත් වර්ෂය සඳහා ලැබිය යුතු විනෝද බදු, කුලී, තක්සේරු බදු සහ වෙනත් හිඟ මුදල් ප්‍රමාණය රු.1,917,919 ක් විය. නගර සභා ආඥා පණතේ 171(අ) වගන්තිය ප්‍රකාරව මෙම මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

2.4 ආර්ථික නොවූ ගනුදෙනු

--------------------------------

(අ) නියමිත දිනයන්හිදී වාහන බලපත්‍ර අළුත් නොකිරීම හේතුවෙන් රු.237,600 ක් වූ අධිභාර ගෙවා තිබුණි.

(ආ) නියමිත දිනයේදී විදුලි ගාස්තු නොගෙවීම නිසා රු.2,564 ක් වූ අධිභාර ගෙවා තිබුණු අතර නැවත සම්බන්ධනය ලබා දීමේ ගාස්තු වශයෙන් රු.11,862 ක මුදලක් ගෙවා තිබුණි.

2.5 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

වාහන ලියාපදිංචි කිරීමේ පොත් නොමැති වීම නිසා සභාවට අයත් සීසෑමේ යන්ත්‍ර 04 ක් නිෂ්ක්‍රීයව තිබුණි.

3. පද්ධති සහ පාලන

-----------------------

පහත සඳහන් පද්ධති සහ පාලප ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් සභාවේ විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ස්ථාවර වත්කම් ලේඛනය

(ආ) පාලන ගිණුම්